# ලයියට පිළිතුරක්

මවිසින් ලියන ලද ජ.වි.පෙ සැඟවුන ඉතිහාසයෙන් බිඳක් (හද රිදවන මතක සුවඳ) කෘතිය 2006 දී පළවිය. එය 2008 සිට "සන්නස" පත්‍රයේ කොටස් වශයෙන් පළවන්නේය. ලයනල් බෝපගේ සහෝදරයා මගේ පොතේ ඇති කරුණු සම්බන්ධයෙන් සිය විචාරාත්මක අදහස් දක්වමින් ලිපි පෙළක් ලියන්නට වුයේ 2008 සැප්: සන්නස කලාපයේ සිටය. බෝපගේ සහෝදරයා වැඩේට අතගසා ඇත්තේ වැරදි අවබෝධයෙන් බව ඔහුගේ පළමු ලිපියෙන්ම මට හැඟී ගියෙන් ප්‍රතිඋත්තර සැපයීමේ අවශ්‍යතාව මතු විය. ඔහුගේ අදහස් දැක්වීම අවසන් වනතුරු මම බලා සිටියෙමි. එහෙත් 2009 ජුනි මාසය වනවිටත් එහි අවසානයක් නොපෙනෙයි. එබැවින් මෙතෙක් පළවු කොටස් කිහිපයකට හෝ පිළිතුරු දිය යුතු යැයි තීරණය කළේ බෝපගේ සහෝදරයාගේ මෙගා ලිපිය නිමාවක් දකින තුරු බලා සිටියහොත් මටද මෙගා පිළිතුරක් ලිවීමට සිදුවන බැවිනි. සන්නසට එවැනි බරක් පැටවීමට මගේ මනාපයක් නැත. වචන අඩුකර ගැනීමේ පහසුව තකා මම මෙතැන් සිට ලයනල් බෝපගේ සහෝදරයාට "ලයියා" යැයි කියමි. එහෙත් එකලද ඔහු ළඟ නැති තැන මිස ඔහුගේ මුහුණට "ලයියා" කියා කෙදිනකවත් අමතා නැත්තෙමි.

කණා මුට්ටිය බිඳින්නාක් මෙන් ලයියාගේ ප්‍රවේශයම පැරදිය.

"මෙම ලිපි පෙළ වගකිවයුතු ආකාරයට සකස් කළේ නම් වඩා උචිත ලෙස ඔහු විසින් කළයුතුව තිබුණේ ඊට අදාළ කරුණු පිළිබඳව යම්කිසි ආකාරයක පර්යේෂණාත්මක ගවේෂණයකුත්, ඒ මත පදනම්ව කරනලද විග්‍රහයකුත් එම ලිපිපෙළ සකස් කිරීමට යොදා ගැනීමයි........" මට ඒ ආකාරයෙන් උපදෙස් දෙන ලයියා ක්‍රියාකර ඇත්තේ ඒ අනුවද? කොහෙත්ම නැත. නිවැරදි ආකාරයෙන් කායඍයම ප්‍රවිශ්ඨ වීමක් නම් ලයියා පළමුව කළයුතුව තිබුණේ මගේ පොත සහමුලින්ම කියැවීමයි. අවශ්‍යතාවය තිබුණිනම් තැපල් මගින් හෝ ලංකාවෙන් පොතක් ගෙන්වා ගැනීමට තිබුණි. අඩුම තරමින් සන්නස සංස්කාරකවරුන්ගෙන් හෝ පොත ඉල්ලාගෙන කියවා බලන්නට අවස්ථාව තිබුණි. ඒ වෙනුවට ලයියා කර ඇත්තේ සන්නස පත්‍රයේ පළවන කොටස් කියවමින් සිය අදහස් පළකිරීමයි. එයින් ලයියාට සිදුවු වැරදීම සුළුපටු නොවේ. *පොතේ මුල් කොටස් කිහිපය මිස අවසානය දක්වා නොකියවීම නිසා ඔහු සිතන්නේ මම තවමත් ජ.වි.පෙ. ක්‍රියාකාරිකයෙකුව සිටිමින් ජ.වි.පෙ හැර ගියවුන්ට ජ.වි.පෙ. වෙනුවෙන් චෝදනා නගන බවයි.* මම ලයියා වෙනුවෙන් මෙම යෙදුම යොදන්නට අකමැති නමුදු සැබවින්ම එය වලිගය පාගා ගැනිමකි. ඔහුගේ ලිපි පෙළට "අන්ධ භක්තිය සහ හද රිදවන මතක සුවඳ" යන මාතෘකාව යෙදීමෙන් පැහැදිලි වන්නේ මෙම වැරදි ප්‍රවිෂ්ටයේ වැරදි අවබෝධයයි. සෝමවංස අමරසිංහ සහෝදරයා මම පක්ෂයෙන් ඉවත් කරන්නේ මා අන්ධානුකරණයෙන් ජ.වි.පෙ. කළ කීදේ අනුමත නොකළ අයෙකු නිසා බව ලයියා තේරුම් ගනු ඇත්තේ පසුවය. එය පසෙක තිබියේවා.

ලයියාගේ මෙම වචන මා තුළ ඇතිකරන්නේ විශ්මයක් නොව පිළිකුලකි. "ඔහුගේ ඊනියා චෝදනා කියවන විට මට මැවී පෙනෙන්නේ අපේ රටේ අනන්තවත් හමුවන, නායකත්වයෙන් කියැවෙන ඕනෑම දෙයක් දෙහොත් මුදුන් තබා වැඳ නමස්කාර කොට පිළිගන්නා, එසේ කියන සියලු දේ අන්ධානුකරණයෙන් අනුගමනය කරන, අන් සියලු දේම අසත්‍ය ලෙස ප්‍රතික්ෂේප කරන චරිතයකි."

අනේ ! අනේ ! බෝපගේ සහෝදරය ඔබට අතීතය අමතකව ඇති හැටි ! නැතහොත් උවමනාවෙන් අමතක කර ඇති හැටි ! ජ.වි.පෙ. වත්මන් ලිලිපුට් නායකත්වය හමුවේ නොව ගලිවර් නායකත්වය හමුවේවත් මම ඔබ කියන වගීයේ චරිතයක් නොවු බව දැන දැනත් ඔබ කියන මුසාවක තරම් !

ඔබ ඇතුළු ජ.වි.පෙ. නායකයන්ගේ ගමන් පහසුව සඳහා වාහන කිහිපයක් මිලදී ගත් වසර මතකද? (ඉන් මද කලකට පසු ඔබලාට බස් දුම්රිය වැනි පොදු සේවා සහ මුලින් අමතක වීම වෙනම කථාවකි) ඔබ දක්ෂ හෝ ප්‍රසිද්ධ කථිකයකු නොවු නිසා කොළඹ මුලස්ථානයේ කටයුතු මිස රටපුරා දිවයාමේ අවශ්‍යතාවක් ඇති නොවුනද ඔබටද කාරයක් තිබුණි. රෝහණ සහෝදරයාට රටපුරාම දිවිමට සිදුවු බැවින් වාහනයක් අත්‍යවශ්‍යම විය. ප්‍රශ්නය වුයේ වාහන පාවිච්චි කිරීම නොව සාමාන්‍ය පොදු ජනතාවගේ ඇස් ඉදිරිපිටටම, ප්‍රසිද්ධ රැස්වීම් භුමි තුළට වාහනයෙන්ම පැමිණ බැසීමය. මාතර උයන්වත්ත ක්‍රීඩා පිටියේ පැවති මහා රැස්වීමකට රෝහණ සහෝදරයා මෙසේ පැමිණෙන කල පොල්හේනේ හසන්ත ගුණවර්ධන සහෝදරයා ප්‍රමුඛ මෝටර් සයිකල් තිබු සහෝදරවරු පරිවාර ආරක්ෂකයන් ලෙසින් කාරය වටකරගෙන පැමිණියහ. අයෙකු රෝහණ සහෝදරයාට බැසීමට දොරද විවෘත කළේය. එම කාලයට අනුව මෙය ප්‍රියජනක දර්ශනයක් නොවීය. මේ ගැන මා නියෝජනය කළ කමිටුවේදී විවේචනාත්මක අදහස් දැක්වු මම මේ පිළිබඳව මුලස්ථානයට කෙලින්ම ලියා යවන්නදැයි විමසුවෙමි. "මටත් ඒ වැඩේ අල්ලන්නේ නෑ. ඕන්නොහේ ලියලා දන්න මහත්තයෝ" නෙත්තිකුමාර සහෝදරයා පැවසීය.

මම රෝහණ සහෝදරයාගේ නමට කෙලින්ම

***ලියුම පත්තු විය. මුලස්ථානය ගිනි ගත්තේය. දිස්ත්‍රික් කමිටු කැඳවිණ. වාද විවාද ඇතිවිය. රෝහණ සහෝදරයාගේ ශරීරාක්ෂාව කටයුතු කළ මාතර අමරේ සහෝදරයා (අමරදාස කුරුප්පු) කුපිත වී වැලිග මට ගොස් රෝහිතගේ දත් කැඩෙන්න පහර දී ආ යුතුයැයි යෝජනා කළේය. ප්‍රශ්නයට පිළිතුර පහරදීම නොව නිවැරදි පිළිතුරක් දීමයයි වෙනත් සහෝදරවරු පැවසුහ. අවසානයේ මාතර දිස්ත්‍රික්කයේ ආසන පහේම පක්ෂයේ ක්‍රියාකාරීන් කැඳවා කරුණු පැහැදිලි කර හඬා වැටුණු රෝහණ සහෝදරයා (ඔහු සමග අපිද හැඬුවෙමු) "රෝහිත සහෝදරයා අද ඉදලා පක්ෂයේ පුර්ණකාලීනයෙක් විදියට වැඩකරන්න බැහැ" යයි පැවසීය. (ලයියා මෙ කතාන්දරය දනියි. මා මෙය ලියුවේ ජ.වි.පෙ. සැඟවුන ඉතිහාසයේ තවත් කතන්දරයක් කීමටය.) ඉහළ මට්ටමේ පුද්ගලයන්ගේ රහස් පහළ කමිටු වලින් හා සාමාජිකත්වයෙන් වසන් කරන ලදී. එහෙත් කෙසේ හෝ ඒවා පහළට කාන්දු විය.***

9 වන පිටුවට

රෝහිත මුණසිංහ


MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students

"EXPERIENCE THE DIFFERENCE"

Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**

Senior Migration Consultants:

Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696

www.multinational.com.au
E-mail : info@multinational.com.au